08



# කුඩා දරුවන් සඳහා corvid වැළැක්වීමට Pizer එන්නත




**කුඩා** දරුවන් සඳහා corvid වැළැක්වීම සඳහා විශේෂයෙන් සකස් කරන ලද Pizer එන්නත දැන් ලබාදීමට සූදානම් කොට ඇත. සෞඛ්‍ය බලධාරීන් දහස් ගණන් කුඩා දරුවන්ගේ ආරක්ෂාව සඳහා ඒ සියල්ල මනාව සැලසුම් කර ඇත.

දරුවන්ගේ දෙමාපියන් එන්නත ලබා දෙන්නේද නොදෙන්නේද යන නොසන්සුන්තාවයක සිටින බව නොරහසකි. කෝවිඩ් වසංගතය දරුවන් කරා පැතිරීම වැලැක්වීම අරමුණු කර ගත් මෙම එන්නත් වැඩපිළිවෙලට සහාය ලබා දෙන ලෙස බලධාරීන් වැඩිහිටියන්ගෙන් ඉල්ලා සිටී. Pizer වර්ගයෙන් කුඩා මාත්‍රාවක් පමණක් වන සේ සකසා ඇති මේ ළමයින් සඳහා වන එන්නත දරුවන්ට සුන්දර අත්දැකීමක් බවට පත් කිරීමට යම් යම් වැඩ පිළිවෙලවල් ඒ ඒ මධ්‍යස්තාන විසින් සකස් කර තිබේ.

ඔන්ටාරියෝ පළාත පුරා ඇති දරුවන් සඳහා ඇති එන්නත් මධ්‍යස්ථානවල ඔවුන්ගේ ලෝකයේ සුපිරි වීර චරිත සමග සෙල්ෆි ගැනීමට හා සෙල්ලම් කිරීමට ද පහසුකම් සලසා ඇත. එමෙන්ම දරුවන් පිනවන ආකාරයේ වර්ණවත් බෑන්ඩ් හා ක්‍රීඩා කාඩ්පත් පැකට් ආදි තෑගි බෝග ද සූදානම් කර තිබේ.

Humber River රෝහලේ කාර්ය මණ්ඩලය Western cross road plaza හී ඔවුන්ගේ එන්නත් සායනයෙහි විශේෂ ළමා කලාපයක් නිර්මාණය කර ඇත. Winter wonder landදුජ් යන තේමාව යටතේ මෙම කලාපය සකසා ඇත. වර්ණවත් පින්තූර පුවරු, හිම පියලි, නේකවර්ණ බැලුම් වර්ග, හිම මිනිසුන් (snow man) ගෙන් සමන්විත මෙම කුඩා කලාපයේ අරමුණ වන්නේ ම එන්නත පිළිබඳව ඇති කනස්සල්ල හා බිය සැක දුරු කිරීම ය.

''අපි ළමයින්ට ප්‍රිය උපදවන ඔවුන්ගේ වීරයන් ගේ රඟපෑම් ඇතුළත් වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කරමු. වර්ණවත් බැලූන්, කෘතිමව පුරවන ලද සතුන් ළමුන්ට සෙල්ලම් කිරීමට සකසා තිබේ. එන්නත ගැන ඇති ඔවුන්ගේ කනස්සල්ල අවම කිරීම අපගේ අරමුණ'' යයි රෝහල් බලධාරීන් පවසයි.

මෙවැනි ළමයින් පිනවන වැඩපිළිවෙළට අමතරව දරුවන් එන්නත සඳහා පෙළඹවීමට දෙමව්පියන්ට සහාය විය හැකි එවැනි කටයුතු සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් හා ක්‍රමවේද සකස් කර ඇත. වැඩි විස්තර නැති සරල සන්නිවේදන ක්‍රම මගින් සෞඛ්‍ය බලධාරීන් දෙමව්පියන්ට උපදෙස් දෙමින් පවසන්නේ corvid එන්නත ලබා දෙන දරුවන්ට 'ඉන්ජෙක්ෂන්' හෝ 'නීඩ්ල්' යන වචන ඇතුළත් නොවන ලෙස කතාබහ කොට එන්නතෙහි යහපත තේරුම් කර දෙන ලෙසයි. ඉන්ජෙක්ෂන් හෝ නීඩ්ල් යන වචන ළමුන් බියට පත් කරන බව ඔවුන්ගේ අදහසයි. පළමු එන්නත සාර්ථකව එන්නත් කරන තුරු දෙවන එන්නතක් ගැන අදහසක් දරුවන්ට නොපවසන ලෙස ද වැඩිදුරටත් ඔවුන් ඉල්ලා සිටියි.

''සමහර දරුවන්ට සෙල්ලම් බඩුවක් හෝ එවැනි වෙනත් දෙයක් අතට දීම ප්‍රයෝජනවත් විය හැකියි. එන්නත හරිම විනෝදජනක දෙයක් ඒ මදුරුවෙක් කනවා වගේ තත්පර දෙකක් නැත්නම් තුනක් තියේවි. දරුවන්ට එහෙම කියන්න පුළුවනි.'' අදාළ බලධාරීන් වැඩිදුරටත් පවසා සිටී.

-yathra news

